| ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය |
|---|
| රැකියා ඇබෑර්තු |

# අධ්‍යක්ෂ / ශාරීරික අධ්‍යාපන

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් ඉහත තනතුර සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් 2020.12.30 දක්වා අයදුම්පත් ලබා ගැනේ.

<u>**අධ්‍යාපන සුදුසුකම්:**</u>

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් ශාරීරික අධ්‍යාපනය පිළිබඳ හෝ ඊට සමාන උපාධියක් සමඟ එවැනි උපාධියක් ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අවුරුදු දහයක් (10) භෞතික අධ්‍යාපන වැඩසටහන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ පළපුරුද්ද.

**හෝ**

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු පිළිගත් ආයතනවල භෞතික අධ්‍යාපන වැඩසටහන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවම වශයෙන් අවුරුදු දොළහක (12) පළපුරුද්දක් සහිත අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම්.

**හෝ**

(ඇ) විශ්ව විද්‍යාල පද්ධතියේ සහකාර අධ්‍යක්ෂ / ශාරීරික අධ්‍යාපන තනතුර දරන එම ශ්‍රේණියේ වසර පහකට (05) නොඅඩු සේවා කාලයක් ඇති සහ එම තනතුරේ සේවය තහවුරු කර ඇති අයෙකු

**වැටුප් පරිමාණ** : *Rs. 66,180 – 8x1335; 8x1630 –89,900 p.m. [U-EX 2(II)]*

**(ඉහත සඳහන් වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.).**

<u>**ප්‍රතිලාභ**</u>

- තෝරාගත් අයදුම්කරුවන්ගේ මාසික වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරන අතර, විශ්වවිද්‍යාලය විසින් 15% ක දායකත්වයක්, වැටුපෙන් 8% ක කොටසක් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලට සහ 7% ක කොටසක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ලෙස දායකත්වය කරනු ලැබේ. තවද ඔවුන් සේවක භාරකාර අරමුදලේ සාමාජිකත්වය දරණ අතර, ඒ සඳහා විශ්වවිද්‍යාලය විසින් මාසික වැටුපෙන් 3% ක කොටසක් සේවක භාරකාර අරමුදල වෙනුවෙන් දායකත්වයක් දරනු ලැබේ.

- ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරින් වසර 07 ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු වසරක් සඳහා වැටුප් සහිතව හෝ වසර දෙකක වැටුප් රහිත සප්ත වාර්ෂික නිවාඩු (sabbatical leaves) සඳහා සුදුසුකම් ලබයි. සප්ත වාර්ෂික නිවාඩු මත විදේශ ගත වීමේ දී එම නිලධාරියාට සහ කාලාත්‍රයාට ගුවන් ටිකට් පත් සඳහා වැය වූ මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමේ හැකියාව ලැබේ

<u>**අයදුම්පත් සහ විස්තර**</u>

අයදුම්පත් , අවශ්‍ය සුදුසුකම් සහ අනෙකුත් විස්තව www.seu.ac.lk යන විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් ලබා ගත හැක. උනන්දුවක් දක්වන අයදුම්කරුවන් අයදුම්පතක් සඳහා රු 200/- මුදලක් ගෙවීමෙන් විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කරගත හැක.

අයදුම්පත් ගාස්තු මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක් මඟින් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ නමට මහජන බැංකුවේ අඩ්ඩාලච්චේන ශාඛාවේ 228-1001-9000-1704 දරණ ගිණුම් අංකයට බැර වෙන පරිදි ගෙවීම් සිදු කල යුතුය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ සහතිකවල පිටපත් ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල උද්‍යානය, ඕලුවිල් # 32360 යන ලිපිනයට 2020.12.30 දිනට හෝ ඊට පෙර ලියා පදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. ඉල්ලුම් කරන ලද තනතුරේ නම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයින් වන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් හරහා තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. නමුත් අයදුම්පතේ ප්‍රගමණ පිටපතක් (Advance Copy) අයදුම් කරුවන්ට මූලිකව එවීමේ හැකියාව ඇති අතර, අදාළ රාජ්‍ය ආයතනයේ ප්‍රධානියා හරහා අයදුම්පත් ඉදිරිපත් කර නොමැති නම්, එවැනි අයදුම්කරුවෙකු පත්වීම සඳහා සලකා බලනු නොලැබේ.

අපේක්ෂකයින් තෝරා ගැනීමේ අවසන් කෙටි ලේඛනය සකස් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සතු වන අතර, සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන්නේ කෙටි ලේඛනයේ ලැයිස්තුගත අයදුම්කරුවන් පමණි.

**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය**
**විශ්වවිද්‍යාල උද්‍යානය, ඕලුවිල් # 32360**
**26.11.2020**